# ප්‍රතිභා

## අපූර්ව වස්තු නිර්මාණයන්හි කුසලතාවය ප්‍රතිභාවයයි

5 වන කාණ්ඩය- 2 වන කලාපය.1999 ජූනි



SRI LANKA GERMAN TECHNICAL TRAINING INSTITUTE OLD BOYS ASSOCIATION OF AUSTRALIA INC

# පණිවුඩ



## ....සභාපතිගෙන්....

ලැබූ සිංහල අලුත් අවුරුද්ද සැමටම සතුට පිරි නවෝදයක්ම වේවායි ප්‍රාර්ථනය කරමි. ඒ වාගේම ආරම්භයේ පටන් මේ දක්වාම සංගමය ඉදිරියට ගෙන යාමට උරදුන් සියලුම දෙනා වෙත ගෞරව ප්‍රණාමය පුද කරන්නෙමි.

1991 වසරේදී සංගමය ආරම්භයත් සමග සැවොම එකට ඒක රාශිවී සහයෝගයෙන් කටයුතු කළ අතර ගැටළු ඇතිවූ විටදී ඒවාට සාර්ථකව මුහුණ දුන්නෙමු. එදා ලබා දුන් සහයෝගය අද දක්නට නොමැති වීම කණස්සල්ලට හේතුවකි.

සාමාජික මහතුන් හා නිළධාරි මහතුන් තම තමන්ගේ වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටු කරන්නේ නම් සංගමයේ දියුණුවත්, ඉදිරියට ගෙන යාමත්, ගැන කථා කළ යුතු නැත්තේය. එනම් සාර්ථකව ඉදිරියට යන බැවිනි. පත්වෙන නිළධාරීන් වෙත සංගමය භාරකොට නිහඬව නොසිටින්න. ඔවුන්ට සහාය දි දිරි ගැන්විය යුතු අතරම යායුතු ගමන් මග පෙන්වන්න. එසේ නොවුවහොත් අවැසි දෙයක් වන්නට ඉඩ නැත්තේ නොවේ. විමසිලිමත් වන්න. එයයි ඔබ වෙත ගෙන එන පණිවුඩය. එසේ නැතිනම් පිරිස් බලයෙන් ඇති පලය කිමද?

සංගමයේ ඉදිරි දියුණුව පතා බොහෝ බලාපොරොත්තු තබා කටයුතු දියත් කළෙමි. එහෙත් ලද සහයෝගය මඳ විය. ඒ නිසාදෝ සමහර කටයුතු නිසි අයුරින් සම්පූර්ණ කිරීමට නොහැකි විය. කිසිවෙකුටත් දොස් පැවරීමෙන් පලක් නොවන්නේය. කණගාටුව ප්‍රකාශ කර සිටිමි. එහෙත් ඉදිරිය එසේ නොවන්නේ නම් සතුටට කාරණයකි.

කෙසේ වී නමුත් පසුගිය වසර කිහිපය තිස්සේ සංගමය මගින් පවත්වනු ලැබූ ජාතික, ආගමික, සංස්කෘතික, ක්‍රීඩා උත්සව හා තරඟ වලදීත් චිත්‍රපට ආදී කර්තව්‍යයන් වලදීත් ඇතිවූ බාධක මැඩලා සාර්ථකව පැවැත්වීමට, සියලුම සාමාජික හා නිළධාරි මහතුන් හා ඔවුන්ගේ නෝනාවරුන් හා දරු දැරියන්ගෙන් ද ලැබුණාවූ සහයෝගය ඉතා අගය කොට සලකන අතර ඔවුන් වෙත විශේෂ ස්තුතිය පුදකර සිටිමි. ඒ වාගේම අපගේ ආරාධනය පිළිගෙන අවුරුදු උත්සවයට සහභාගි වූ වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයාණන් නියෝජනය කළ පැන්ඩපොලස් මහතාටද සංගමය වෙනුවෙන් ස්තුති කර සිටිමි. ඒ වාගේම සංගමයේ නොයෙකුත් කටයුතු වලදී බාහිර පරිත්‍යාගශීලී භවතුන් වෙතින් ලැබූ සහායට ඔවුන් වෙත ස්තුතිය පුද කරන්නෙමි.

අප සංගමයට ගොඩනැගිල්ලක සම්පූර්ණ අයිතිය දැන් හිමිව ඇත්තේය. මෙය උදාකර දීමට පුරෝගාමී වූ සියලුම දෙනාද ස්තුති පූර්වකව මතක් කර සිටිමි.

අවසාන වශයෙන් ඉදිරි වසර සඳහා සුහද හමුවෙන් පසුව පත්වන නව නිළධාරි මහතුන් වෙත සුහදව වැඩි වශයෙන් සහාය වීමෙන් හා නොයෙකුත් අවස්ථා වලදී පැමිණ සහභාගී වීමෙන් සංගමය දියුණුවත් සමග ඉදිරියට ගෙන යාමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ස්තුතියි,
ධර්මපාල කොඩිකාරගේ

## ඕස්ට්‍රේලියානු දිනය සැමරීම හා විවෘත ක්‍රිකට් තරඟාවලිය.

අප සංගමය බාහිර ශ්‍රී ලාංකික ජනතාවත් ඕස්ට්‍රේලියානු සමාජයත් එකට එකතු කර ඕස්ට්‍රේලියානු දිනය සැමරීම වස් විවෘත ක්‍රිකට් තරඟාවලියක් හා සැණකෙළියක් ප්‍රථම වරට 1999 ජනවාරි මස 26 වෙනි දින KELLY PARK හිදී පවත්වන ලදී. සුනිල් පෙරේරා මහතා ප්‍රමුඛ ක්‍රීඩා නිළධාරිවරුන් වන චත්ත කුමාර, ජගත් සේනාරත්න හා ධර්මවංශ යන මහත්වරු මෙහි සංවිධාන කටයුතු මෙහෙයවන ලද අතර උත්සව බිම තුළ පැවැත්වූ ආහාර හා තේ වෙළඳ සැල සංවිධානය හා එහි මෙහෙයවීම් කටයුතු, අබේරත්න, සිසිර, ජයන්ත හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහභාගිත්වයෙන් කරන ලදී. තරඟාවලිය සඳහා ක්‍රිකට් ක්‍රීඩා කිරීමට කණ්ඩායම් විස්සක් පමණ සහභාගි වූ අතර ළමුන් සඳහා ප්‍රියජනක අංගයන් කිහිපයක් තිබුණි. ජයග්‍රාහකයන් සඳහා කුසලාන හා මුදලින් තෑගි ප්‍රදානය කරන ලදී. ඒ අතරට ප්‍රණීත ආහාර පොළක් ද එක්විය. කාළගුණ තත්වය නරක අතට හැරී තිබුණත් උත්සවය සාර්ථක විය. බාහිර තරඟ විනිශ්චය කරුවන් යොදා තිබුණ අතරම බොහෝ පරිත්‍යාගශීලීන් අනුග්‍රහය දක්වා තිබුණි. සංගමය විසින් සියල්ලන්ගෙන්ම ලැබුණ සහය සදා අගය කරනු ඇත.

### 1999 වසරේ සමීක්ෂණ ප්‍රතිඵලය

සංගමය මගින් පවත්වනු ලැබූ 1999 වසරේ සමීක්ෂණය සඳහා ලැබුණ සහයෝගය ඉතාමත්ම අල්ප බැවින් සාර්ථක ප්‍රතිඵලයක් වාර්තා කිරීමට නොහැකි වන බව කණගාටුවෙන් මුත් දැනුම් දෙමු.

1999 අප්‍රේල් මස 18 වැනි දින බක්මහ උළෙලේ දී දිනුම් අදින ලද අවුරුදු උදාන ලොතරැයියේ වාසනාවන්තයන් හා දිනුම් අංක මෙසේය.

| ස්ථානය | දිනුම් අංකය | ජයගත් අය |
|---|---|---|
| පළමු | 0315 | වසන්ත කුලතුංග |
| දෙවන | 2262 | යසිත අමරසිංහ |
| තෙවන | 1532 | නන්දනී රාජපක්ෂ |
| සැනසිලි | 1564 | එම්.බී.එස් ප්‍රනාන්දු |
| ↓ | 2259 | ලහිරු කුලතුංග |
| | 2370 | කේ.සී. පත්මසිරි |
| | 1543 | ධම්මික පල්ලියගුරු |

සංගමයේ කටයුතු, පහසුවටත් ඉක්මනිනුත් පවත්වාගෙන යාම සඳහා පරිගණක ක්‍රියා පිළිවෙළ(Computer Program)ක් සකස් කිරීමට අවශ්‍යව ඇත. එය සකස්කර දීමට උනන්දුවක් දක්වන සාමාජික මහතුන් හෝ ඔවුන්ගේ භාර්යාවන් සිටින්නේ නම් කරුණාකර සංගමය වෙත ලියා දන්වන මෙන් ඉල්ලා සිටිමු. ආදර්ශ සටහනක් ඉදිරි පිටුවේ දක්වා ඇත.


[Manual input] APPLICATION DETAILS
[Process] CHECK FOR PREVIOUS ENROLMENTS
NO
YES
[Document] PRINT LETTER TO APPLICIANT
NOT APPROVED
NOT APPROVED
[Manual operation] MEMBERSHIP ACCEPTANCE
APPROVED
[Process] REGISTER NEW MEMBER,& OPEN FILES
[Process] PRINT ACCEPTANCE LETER,CO.MEMBER DETAILS,AREA & COPY OF CONSTITUTE
[Manual input] ENTER CHANGES OF AREA TRANSFERS,NEW BIRTHS,UPDATES
[Process] MAKE CHANGES
[Document] PRINT NEW DETAILS FOR PERSONAL FILE & CO.MEMBER
UPDATE
[Stored data] REJECTIONS
[Stored data] PERSONAL DETAILS
[Stored data] FUNARAL DETAILS
[Stored data] ACCOUNT DETAILS
[Stored data] OTHER
MAIN DATA STORE
LINK
[Manual input] ENTER NEW PAYMENT DETAILS TO MEMBERSHIP FUNERAL BUILDING & OTHER FUNDS
UPDATE
[Document] PRINT REJECTION
UPDATE
NO
[Manual input] ENTER FUNERAL ASSISTANCE APPLICATION DETAILS
[Process] CHECK FOR ELIGIBILITY
YES
[Process] PRINT CHECK & SYMPATHY CARD
UPDATE
[Process] PRINT 1ST,2ND, 3RD LETTERS TO MEMBER WITH COPYS TO C.MEMBER,SECRETARY, PERSONAL FILE
[Process] SORT ACCOUNTS FOR MEMBERS DUES
[Process] PRINT REPORTS WHEN NECESSARY
[Process] ANALYZE ACCOUNTS
[Process] HIGHLIGHT/DELETE FROM DATABASE
[Process] SORT CHILDRENS FOR OVER 18yrs
ACCOUNTING SYSTEM
CASH
MEMBERSHIP
SPECIAL FUNCTIONS
FUNERAL ASSISTANCE
BUILDING ACCOUNTS
BUILDING FUND
BUILDING MAINTENANCE
INCOME
EXPENSES

## 1998-99 වසර තුළදී පැවැත්වූ ක්‍රීඩා උත්සව

### විවෘත ක්‍රිකට් තරහාවලිය

ශූරතාවය "NOBLE PARK B"



විවෘත කිරීම



අනුශූරතාවය "SUPER SIX"



### ක්‍රිකට් හා දැල් පන්දු තරහාවලිය

ශූරතාවය "CAMPBELLFIELD"



ප්‍රදර්ශන කණ්ඩායම "CHERRIES"



ශූරතාවය "CITY SIDE"



අනුශූරතාවය "NOBLE PARK A"



ප්‍රදර්ශන කණ්ඩායම "REJECT"



අනුශූරතාවය "YELLOW BIRDS"



# ශෝකී මතක සටහන්

"හොඳයි!, ඔබ රෝහලට ගෙනා දිනයේ උදෑසන, රෝහල් බලධාරීන් විසින් ඔබ මිය යමින් සිටින බවත් ඔබව බේරා ගැනීමට ඇති ඉඩකඩ සොයා බලන ලෙසත් මට දැන්වූවා. ඒ අනුව, පළපුරුදු හා ආධුනික වෛද්‍යවරුන්ගෙන් සමන්විත අප කණ්ඩායම ඔබ බැලීමට පැමිණියා. මේ රෝගය ඉතාමත් කලාතුරකින් සිදුවන දෙයක් මෙන්ම, රෝගියා ජීවත් කරවීමට ඇති ඉඩකඩ ඉතාමත්ම අඩු බැවින් මෙය අපට අභියෝගයක් වුණා. එමෙන්ම පෙනහලුවල කරතිබූ ශල්‍යකර්මය හේතුවෙන් මෙය ඔබට තදින්ම බලපා ඇති නිසා ඉතාම කල්පනාකාරීව කටයුතු කළයුතු බව අපට හැඟුණා. ඔබගේ ශරීර ශක්තිය තබා ගැනීම ඉතාම අත්‍යවශ්‍යවූ නිසා ශරීර ශක්තිකරණ දියර, නලයක් මාර්ගයෙන් නාසය හරහා ආමාශයට යැවීමට අවශ්‍ය කටයුතු මුළින්ම සම්පාදනය කළා. එදින ගත් X කිරණ ජායාරූපයට අනුව, පැපොල රෝගයට අමතරව, පෙනහලු ඇතුළ සෙම පටලයන්ගෙන් වැසෙන්නට පටන්ගෙන තිබුණ නිසා දෙවැනි පියවර වශයෙන් සෙම වියලන ද්‍රව්‍ය (Ventoline) පෙනහලු ගතකිරීම ඇරඹුවා. දුර්වල වෙමින් තිබූ ඔක්සිජන් ක්‍රියාවලිය පිටතින් සැපයූ ඒවායින් පණ ගැනුනත් පෙනහලු ප්‍රසාරණය වීමේ ක්‍රියාවලියට එයින් පිහිටක් ලැබුණේ නැහැ. හතරවැනි දිනයේදී, පෙනහලු ප්‍රසාරණය වීම ඉතාම දුර්වල අඩියකට පත්වුන අතර ඒවා නැවතීමෙන්, ඔබ මියයාමේ තර්ජණයට අපි මුහුණ පෑවා. අපගේ අවසාන ප්‍රයත්නය වශයෙන්, ආශ්වාස යන්ත්‍රය ඔබේ සිරුරට සවිකර, එමගින් පෙනහලු ප්‍රසාරණය කරවීමට තීරණය කළා. මේ සඳහා අවශ්‍ය නලමාර්ග, ස්වාසනාලයට සවි කිරීමට, ඔබගේ ගෙල සිදුරු කළ යුතුවූ බැවින් ඒ අවසරය ඔබේ බිරිඳගෙන් ලබාගෙන ඒ කාර්යය යුහුසුළුව කළා. ඉන්පසු සෑහෙන දිනක් ඔබේ පෙනහලු ක්‍රියා කළේ යන්ත්‍රානුසාරයෙන්. මේ අනුව පෙනහලු ක්‍රියාකාරිත්වය හා ඔක්සිජන් ක්‍රියාවලිය ස්ථාවර වුවත් ශරීරයේ උෂ්ණත්වය අඩුනොවෙමින් පැවතුණ නිසා විෂබීජ, මොළය තුළට ගමන් කර ඇතැයි යන සැකය ඇතිවුනා. මෙමගින් ඔබ සදාකාලික මාණසික රෝගියෙකු බවට පත්වීමේ තර්ජණයට අප මුහුණ පෑවා. මෙය සැක හැර දැන ගැනීම සඳහා කළ යුතු පරීක්ෂණයට, ඔබ අවදියෙන් සිටිය යුතුවූ නිසා අපි ඔබේ නිඳි බෙහෙත් සැපයුම තාවකාලිකව නවතා දැම්මා. මෙම පරීක්ෂණය කළේ වාට්ටු භාර වෛද්‍යවරයායි. ඔහු අපට සැපයූ වාර්තාවට අනුව ඔබේ නම කියා, ඒ ඔබ නේදැයි ඇසූවිට හිස සොලවා ඔබ එකඟ වී ඇති අතර ඔහුට සිතුණ නමක් යොදා, ඒ ඔබගේ දියණිය නේදැයි ඇසූවිට හිස දෙපසට වනා නැතැයි කියා තිබුණා. මේ අනුව ඔබේ තත්වය යහපත් අතට හැරෙන බවට විශ්වාසයක් අප ඇති කර ගත්තා. දහවැනි දිනයේදී ගත් X කිරණ ජායාරූපයට අනුව පෙනහලු තුළ පැපොල වර්ධනය නැවතී ඇති බව පෙනී ගියෙන් ඔබගේ නිදි බෙහෙත් නවතා දැමීම කළා." යි කියා මදකට නැවතුනු ඔහු නැවතත්,

"නියමිත වේලාවට ප්‍රතිකාර ලැබීමත් රුධිරයේ අඩංගු මේද හා සීනි සංයුතිය අධික නොවීම නිසා ඔබේ සිරුරේ තිබූ දැඩි රෝග ප්‍රතිශක්තියත් ඔබේ දිවි බේරීමට හේතු වන්නට ඇතැයි අප සිතනවා. එමෙන්ම ඔබ වෙනුවෙන් බොහෝ අය යාඥා කරන්නත් ඇති.....

ඔබ මිය නොයාවී යයි එක්තරා සේයාවක්, මගේ හිත තුළ ඇතිවී තිබුණ නිසා දැඩි සත්කාර ඒකකයට පැමිණ. ඔබගේ තත්වය පරීක්ෂාකර පිටත්ව යාමට පෙර, නින්දේ පසුවන ඔබ දෙස බලාගෙන හිත යටින් මම මෙසේ කීවා,

*"දිගටම සටන් කරන්න. නවතා දමන්න එපා. ඔබට මෙය කළ හැකියි...."*

හොඳයි! අපි පිටත්ව යාමට පෙර, තව එක දෙයක් කියන්න සතුටුයි. ඔබගේ ජීවිතය බේරීම, දශලක්ෂයකින් එක් අයෙකුටවත් නොලැබෙන ආකාරයේ දුර්ලභ එකක් බව හොඳින් මතක තබා ගන්න." යැයි කියමින් ඔහු නැවතිණි. මගේ ජීවිතය බේරාදීම වෙනුවෙන්, ඔවුන් සියලු දෙනාටත්, රෝහලටත්, එහි සෙසු කාර්ය මණ්ඩලයටත්, මම ස්තුති කළෙමි. අහිංසකව සිනාසුනු ඔවුන් මට නැවතත් ශුභපතා පිටත්ව ගියෝය.

එදින සවස් වරුවේ, මම බිරිඳත් කැටුව. දැඩි සත්කාර ඒකකයට ගියෙමි. ඔවුන් සිනාසී අප පිළිගත්තෝය. දින දහයකට වඩා මා හට සාත්තු කළ ඔවුන්ගේ මුහුණු පළමු වරට දැක්කේ එදිනය. මා රඳවා සිටි කාමරය පෙන්වන ලෙසින් මම ඔවුන්ගෙන් ඉල්ලා සිටිය නමුත් අසාධ්‍ය රෝගියෙක් එතුළ දැඩි ප්‍රතිකාර ලබන නිසා එම ඉල්ලීම ඉටු කළ නොහැකි බව ඔවුන් කණගාටුවෙන් පැවසිය. මා වෙනුවෙන් කරන ලද සේවයට ඔවුන්ටද ශුභපතා ආපසු ආවෙමු. රට පසු දිනයේ දී රෝහලේ අවසරය ලැබ නිවස කරා ආවෙමි.

## සටහන

මා නිඳි ගන්වා තිබූ කාලය, ලොමු දැහැගැන්වූ සිහින සාගරයක් විය. සිත සතුටු වන ආකාරයේ සිහින දුටුවේ ඉතා අල්ප වශයෙනි. ඒ අතුරින්, මෙල්බර්න් නගරයෙන් දුම්රියට ගොඩවන මා හා බිරිඳට, හැලම් දුම්රිය ස්ථානයෙන් බැසීමට අමතක වූ නිසා රළහ නැවතුම වූ නැරි වැරන් දුම්රිය ස්ථානයෙන් බැසීමට යනවිට දොරෙන් එළියේ තිබූ දැඩි අඳුරට බියවී, නොබැස ආපසු හැරෙන සිහිනය, නිතර නිතර දුටු එකක් මෙන්ම ජීවිතය පිළිබඳ යම් බලාපොරොත්තුවක් ඇති කළ එකක් මෙන් ද මගේ මතකයේ රැඳී ඇත.

මගේ තත්වය යහපත් අතට හැරී ඇති බවත් මා නින්දෙන් නැගිට ඇති බවත් යන පණිවිඩය, මගේ බිරිඳට ලැබුණේ, මට සෙත්පතා කරන ලද බෝධිපූජා අවසන් දිනයේ අවසන් කටයුත්ත වූ බෝධිය නෑවීම අවසන් වෙනවාත් සමගය. ඇය, මේ බව ශ්‍රී ලංකාවේ පිහිටි මගේ සොහොයුරාගේ නිවසට දුරකතනයෙන් දන්වන විට ඔවුන් ඔවුන්ගේ බෝධිපූජා සත්වෙනි දිනය නිමවා නිවසට ගොඩවූවා පමණි.

මගේ දිවි බේරූ මෙම රෝහලට, වාර්ෂිකව මුදල් පරිත්‍යාග කරන්නන්ගේ ලයිස්තුවට මමද ඇතුල්වී සිටිමි.

එම රුදුරු අත්දැකීමේ ආවර්ජනය මෙතෙකින් නිමි. එය, ඉතාමත් කටුක, අමිහිරි හා බියකරු එකක් විය. මෙනිසාම, ලොව උපන් කිසිවෙකුට මෙවන් ඇබැද්දියක් නොවේවායි මම පතමි.

(මු.තෙන්නකෝන්.